# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ - 02 සේවා ගණයේ තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය) III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2025(2026)

01. අමප 25/1691/802/004 – X හා 2025.09.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි **තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)** III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 නොවැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www. doenets.lk** වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Applications – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 අගෝස්තු මස 03 වැනි දින පෙ.ව. 09.00ට** විවෘත වන අතර **2026 අගෝස්තු මස 31 දින ප.ව. 09.00ට අවසන් වේ.**

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව **තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)** III ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ලැබේ.

03. පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ.

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහ 2022.12.14 දිනැති** ***අති විශෙෂ ගැසට් පත්‍රයේ*** **පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)** III **ශ්‍රේණියේ තනතුරට** පත් කරනු ලැබේ.

(ආ) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, අමාත්‍යාංශ ලේකම් හට ඒ සඳහා බලය ඇත.

(ඇ) මෙම පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්වේ. **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) බණ්ඩ - 02 සේවා ගණයේ** බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් පරිදි බඳවාගෙන වසර 03ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු යි.

(ඈ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

**04. 2025.03.25** දිනැති **10/2025** දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි **MN 01-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු.45,230 -10x540 -11 x 630 -10 x 890 - 10 x1,190 - රු. 78,360 ක් වේ. එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මකවන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.**

05. **මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.)**

06. **තනතුරට අයත් කාර්ය භාරය :**

**තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)**

**1. පාසල්වල තාක්ෂණ පීඨයේ ජෛව පද්ධති තාක්ෂණවේදය විද්‍යාගාර පිළිබඳ භාරකාරිත්ව හා ඒ පිළිබඳ සම්පූර්ණ වගකීම.**

**2. ජෛව පද්ධති තාක්ෂණවේදය උපකරණ තොග පවත්වාගෙන යාම හිඟ හඳුනා ගැනීම හා අවශ්‍ය ප්‍රමාණ ඇණවුම් කිරීම සඳහා සහාය වීම හා භාණ්ඩ නිදහස් කිරීම.**

**3. අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ තිබෙන උපකරණ අලුත්වැඩියා කිරීම, රසායනාගාර ද්‍රව්‍ය, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, උපකරණ, ගබඩා අල්මාරි ආදියට සිදු විය හැකි අලාභහානි වලක්වා ගැනීම, ඒවා සොරසතුරන්ගෙන් ආරක්ෂා කිරීමට කටයුතු සැලැස්වීම හා එසේ විය හැකි අවස්ථා අවම කරලීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.**

**4. රසායනික ද්‍රව්‍ය, පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, උපකරණ, ගබඩා අල්මාරි ආදි පරීක්ෂණාගාරයේ තිබෙන සියලුම භාණ්ඩ පිළිබඳව පූර්ණ වගකීම හා අදාළ ලේඛන ක්‍රමානුකූලව පවත්වාගෙන යාම.**

**5. අවශ්‍ය පරීක්ෂණ කිරීම සඳහා ගුරුවරුන්ට හා සිසුන්ට සහාය ලබා දීම.**

**6. උපකරණ හා ද්‍රව්‍යවල ආරක්ෂාව පිළිබඳව වඩාත් සැලකිලිමත් වෙමින් අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම.**

**7. තාක්ෂණ පීඨයේ අධ්‍යයන කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට හැකි වන පරිදි කටයුතු සංවිධානය කරලීම.**

**8. රසායන ද්‍රව්‍ය නිසි පරිදි අසුරා තැබීම, ගබඩා කිරීම මගින් සිසුන් හට සිදු විය හැකි හානිවලින් ආරක්ෂා කිරීම.**

**9. තම විෂය පථයට අදාළ කරුණු පිළිබඳව තමාගේ අධීක්ෂණ නිලධාරීන් සමඟ මනා සම්බන්ධතාවක් පවත්වා ගැනීම සහ ඔවුන් විසින් පවරන වෙනත් රාජකාරී ඉටු කිරීම.**

07. *සුදුසුකම් : -*

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයට** අයත් තනතුරුධාරීන් සීමිත පදනම මත **තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)** යන තනතුරට අයදුම් කිරීමට,

**(අ)** *අධ්‍යාපන සුදුසුකම් : -*

**තාක්ෂණ පීඨ සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය)**
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී මව් භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතු ය.

**(ආ)** පළපුරුද්ද : -

නියමිත දිනට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථාන ඇතුළු සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත් ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

**(ඇ)** *වෙනත් සුදුසුකම් : -*

I. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර පත්වීමක් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කර තිබිය යුතු ය.

II. යම් තනතුරක ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම්/ කොන්ත්‍රාත් පදනම මත සේවා කාල පරිච්ඡේදයන් සහ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇති පුහුණුවීම් කාල පරිච්ඡේද ගණන් ගනු නොලැබේ.

III. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති විය යුතු ය.

V. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර තිබිය යුතු ය.

VI. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

08. *විභාග පටිපාටිය :*

මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලු ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම්කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

09. ඇගයීමේ ක්‍රමවේදය

| | ලකුණු | |
|---|---|---|
| සාමාන්‍ය දැනීම (ලිඛිත පරීක්ෂණය) | 100 | (කාලය පැය 01) |
| බුද්ධි පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | 100 | (කාලය පැය 01) |
| යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය | 50 | |

**I සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි ලකුණු 100 )**

ඉහත 06 හි දක්වා ඇති පරිදි තනතුරට අදාළ රාජකාරී ඉටු කිරීමට අවශ්‍ය සාමාන්‍ය දැනීම.

**II බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01යි ලකුණු 100 )**

අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සකස් කර ඇති බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

**III යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය (ලකුණු 50 )**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයන් විසින් මෙහි 10 ඡේදය යටතේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු යි. මෙහි දී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අයදුම්කරුවන්ට සහ එම අයදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ.

මෙම තරග විභාගය මගින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය යන එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් බැගින් ලබා සමත් විය යුතු ය. ලිඛිත විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලිඛිත පරීක්ෂණයේ ලකුණු හෝ කුසලතා අනුපිළිවෙළ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙනු නොලැබේ) ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව ලකුණු ලබා දෙන අතර මූලික සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත් ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුව මත එක් එක් අයදුම්කරුවන්ගේ කුසලතාව නිර්ණය කරනු ලැබේ.

**10. කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව තාක්ෂණ පීය සහකාර (ජෛව පද්ධති තාක්ෂණවේදය) තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ පටිපාටිය - 2025(2026)**

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *ලකුණු ලබා දෙන ආකාරය* | *උපරිම ලකුණු* | |
|---|---|---|---|
| 01. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>(i) අ.පො.ස (සා.පෙළ) | • විශිෂ්ට සාමර්ථ්‍යය - එක් විෂයයකට ලකුණු 02 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 01 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් (ගණිතය, මව්බස, ඉංග්‍රීසි තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යය ලබා තිබීමට අමතරව ) | 10 | **15** |
| (ii) අ.පො.ස (උ.පෙළ) | • විශිෂ්ට සාමර්ථ්‍යය - එක් විෂයයකට ලකුණු 2 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 1 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් | 5 | |

| ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර | ලකුණු ලබා දෙන ආකාරය | උපරිම ලකුණු | |
|---|---|---|---|
| (iii) උපාධි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. | 15 | |
| 02. සේවා පළපුරුද්ද | අවුරුදු 05න් පසු වැඩිවන සෑම වර්ෂයකටම ලකුණු 02 බැගින් | 15 | **15** |
| 03. පරිගණක හැකියාව<br>• රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට අදාළ ආයතනයෙන් ලිඛිත ලියවිල්ලක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි | රජයේ ලියාපදිංචි ආයතනයකින් පිරිනමන ලද පරිගණක පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ සහතිකයක් | 3 | **5** |
| | රජයේ ලියාපදිංචි ආයතනයක පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | 2 | |
| 04. මව් භාෂාව හා දෙවන භාෂාව හැර වෙනත් භාෂාවක ප්‍රවීණතාව (සහතික මඟින් සනාථ කළ යුතුය) | ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් පිළිබඳව අවම වශයෙන් ඩිප්ලෝමාවක් සම්පූර්ණ කිරීම | 5 | **5** |
| | අ.පො.ස. (උ.පෙළ) විෂයයක් ලෙස ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් හදාරා තිබීම (01 යටතේ ලකුණු ලබා දුන්නේ නම් මේ සඳහා සලකා බලනු නොලැබේ.) | 2 | |
| 05. ආයතනයේ අභිවෘද්ධියට දක්වන ලද දායකත්වය | ප්‍රශංසා ලිපි - එක් ලිපියකට ලකුණු 2.5 බැගින්<br>• තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතු යි. | 5 | **5** |
| | ඇගයීම් එක් ලිපියකට - එක් ලකුණ බැගින්<br>• තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතු යි. | 5 | |
| 06. සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාව | පෞරුෂත්වය | 3 | **5** |
| | සන්නිවේදන කුසලතා | 2 | |
| | භාෂා හැසිරවීම | 1 | |

(සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතුය.)

***සටහන 1***

සහතිකය ඉදිරිපත් කරනු ලබන ආයතනයේ රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් විය යුතු අතර එසේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට ලියාපදිංචි අංකය සඳහන් ලිඛිතව තහවුරු කිරීමක් අදාළ ආයතනය වෙතින් ලබාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරු විසින් සිදු කළ යුතු ය.

11. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් :*

I. අයදුම්පත් පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රාජ්‍ය සේවයෙන් පහ කිරීමට වුව ද යටත්වේ.

12. *විභාග කොන්දේසි :*

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (Email) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම්කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේදී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග ගාස්තුව ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතුය.

(*අ*) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මඟින්(Any Bank Credit Card)
(*ආ*) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මඟින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)
(*ඇ*) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මඟින් (Online Banking Method/ Flex App of Bank of Ceylon)
(*ඈ*) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මඟින් ( Any Branch of the Bank of Ceylon)

***සටහන :-***

ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

14. ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මඟින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් වශයෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

15. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

16. අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

17. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

18. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

19. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

20. අමාත්‍යාංශ ලේකම් විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනයක් දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත.

**21. විභාගයට ඇතුළත් කර ගැනීම :**

(*අ*) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම

එම ශාලාවේ පෙනී සිටින පළමු විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළකර ඇත.

*සටහන* - අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

22. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත ;
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමකින් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳගෙන නොමැති බව තහවුරුකර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

23. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කලුවැව,**
ලේකම්.

2026 ජූලි මස 21 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

07 - 499/1

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණයේ තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය) III ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන සීමිත තරග විභාගය - 2025(2026)

01. අමප 25/1691/802/004 – X හා 2025.09.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි **තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)** III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2026 නොවැම්බර් මස පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ* **www. doenets.lk** වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications – Recruitment Exams/ E.B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. **මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2026 අගෝස්තු මස 03 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 අගෝස්තු මස 31 දින ප.ව. 09.00ට අවසන් වේ.**

නිලධාරීන් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාරදිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේදී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

02. විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව **තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)** III ශ්‍රේණියේ තනතුරු සඳහා පත්කිරීමට තෝරා ගනු ලැබේ.

03. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය අමාත්‍යාංශ ලේකම් විසින් නිශ්චය කරනු ලැබේ.

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව සහ 2022.12.14 දිනැති** ***අති විශෙෂ ගැසට් පත්‍රයේ*** **පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය**

පටිපාටික රීතිවලට ද යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය) III ශ්‍රේණියේ තනතුරට පත් කරනු ලැබේ.

(ආ) පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේ අවම වශයෙන් වසර (03) අනිවාර්යයෙන්ම සේවය කළ යුතු ය. කෙසේ වෙතත් අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතු මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම්, අමාත්‍යාංශ ලේකම් හට ඒ සඳහා බලය ඇත.

(ඇ) මෙම පත්වීම එක් අවුරුදු වැඩබැලීමේ කාලයකට යටත්වේ. **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02** සේවා ගණයේ බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් පරිදි බඳවාගෙන වසර 03ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු යි.

(ඈ) පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් සුදුසුකම් සපුරාලූ භාෂා මාධ්‍යයට අනුව 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන අංක 18/2020 සහ ඊට ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව අදාළ පරිදි රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සම්පූර්ණ කළ යුතු වේ.

**04. 2025.03.25 දිනැති 10/2025 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි MN 01-2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර එයට අදාළ වැටුප් පරිමාණය රු.45,230 -10x540 -11 x 630 -10 x 890 - 10 x1,190 - 78,360 ක් වේ. එම වැටුප ඔබට හිමි වන්නේ 2027.01.01 දින සිට වේ. පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.**

05. **මෙම තනතුර ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වේ. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් වේ.)**

06. **තනතුරට අයත් කාර්ය භාරය :**

**තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)**

**1.** පාසල්වල තාක්ෂණ පීඨයේ ඉංජිනේරු තාක්ෂණවේදය (සිවිල් තාක්ෂණවේදය, විදුලි තාක්ෂණවේදය හා යාන්ත්‍රික තාක්ෂණවේදය) විද්‍යාගාර තුනෙන් නියමිත විද්‍යාගාරයෙහි උපකරණ පිළිබඳව සම්පූර්ණ වගකීම.

**2.** ඉංජිනේරු තාක්ෂණවේදය (සිවිල් තාක්ෂණවේදය, විදුලි හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණවේදය හා යාන්ත්‍රික තාක්ෂණවේදය) අදාළ තොග පොත් හා ක්ෂය ද්‍රව්‍ය ලේඛන විෂයය උගන්වන ගුරු භවතුන්ගේ අධීක්ෂණය යටතේ නිසි පරිදි පවත්වාගෙන යාම.

**3.** හිඟ හඳුනා ගැනීම හා අවශ්‍ය ප්‍රමාණ ඇණවුම් කිරීම සඳහා විෂයය උගන්වන ගුරු භවතාට සහාය වීම.

**4.** අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති තාක්ෂණ පීඨ මාර්ගෝපදේශ සංග්‍රහය පිළිබඳ අවබෝධය හා ඒ අනුව කටයුතු කිරීම සහ ඉදිරියේදී නිකුත්වන චක්‍රලේඛ හා රෙගුලාසි අනුව කටයුතු කිරීම.

**5.** අවශ්‍ය අවස්ථාවන්හිදී අදාළ ක්‍රියාකාරකම් සඳහා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, විෂය උපකරණ වැඩ මේස හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු කරන ස්ථාන සිසුන් වෙත සූදානම් කර දීම හා ඊට අවශ්‍ය සහයෝගය ලබා දීම.

**6.** අලුත්වැඩියා මට්ටමේ පවත්නා උපකරණ හඳුනාගැනීම හා ඊට අදාළ නඩත්තු කටයුතු හා අලුත්වැඩියා කටයුතු සිදු කිරීම.

**7.** ක්‍රියාකාරකම් අවසන් වූ පසු අදාළ විෂය උපකරණ නඩත්තු ක්‍රියාකාරකම්වලට යටත්ව ඒවා නැවත ගබඩා කිරීම.

**8.** තාක්ෂණ පීඨයේ ප්‍රධාන විදුලි පරිපථය හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදු වන අවස්ථාවේ හා ක්‍රියාකාරකම් අවසන් වූ පසු ආරක්ෂක ක්‍රමවේද අනුගමනය කිරීම.

**9.** කර්මාන්ත ශාලාවක් තුළ පවත්වාගෙන යා යුතු ආරක්ෂක ක්‍රමවේද පිළිබඳ අවබෝධය හා ඒ අනුව කටයුතු කිරීම.

**10.** තම සේවා විෂය පථයට අදාළ කරුණු පිළිබඳව තමාගේ අධීක්ෂණ නිලධාරීන් සමඟ මනා සම්බන්ධතාවක් පවත්වාගෙන යාම සහ තනතුරට අදාළ පවරනු ලබන වෙනත් රාජකාරි ඉටු කිරීම.

07. **සුදුසුකම් : -**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයට අයත් තනතුරුධාරීන් සීමිත පදනම මත **තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)** යන තනතුරට අයදුම් කිරීමට,

(අ) **අධ්‍යාපන සුදුසුකම් : -**
**තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය)**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී මව් භාෂාව, ගණිතය සහ විද්‍යාව යන විෂයයන්ට සහ තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.

**(ආ) පළපුරුද්ද : -**

නියමිත දිනට අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ජාතික පාසල්, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ, ගුරු විද්‍යාල, ගුරු මධ්‍යස්ථාන ඇතුළු සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත් ආයතනයන්හි ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**(ඇ) වෙනත් සුදුසුකම් : -**

I. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ප්‍රාථමික සේවා ගණයේ ස්ථිර පත්වීමක් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කර තිබිය යුතු ය.

II. යම් තනතුරක ස්ථිරව පත්කරනු ලැබීමට පෙර සේවය කර ඇති තාවකාලික/ අනියම්/ කොන්ත්‍රාත් පදනම මත සේවා කාල පරිච්ඡේදයන් සහ යම් තනතුරකට ස්ථිර වශයෙන් පත් කිරීම සඳහා කොන්දේසියක් වශයෙන් සේවය කර ඇති පුහුණුවීම් කාල පරිච්ඡේද ගණන් ගනු නොලැබේ.

III. සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොමැති විය යුතු ය.

V. නියමිත දිනට අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කර තිබිය යුතුය.

VI. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවකින් යුක්ත විය යුතු ය.

VII. උපරිම වයස් සීමාවක් අදාළ නොවේ.

08. විභාග පටිපාටිය :

මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. අයදුම්කරුවකු තමාට අදාළ එක් මාධ්‍යයක් තෝරා ගත යුතු අතර විභාගයට නියමිත සියලු ප්‍රශ්න පත්‍ර සඳහා එම මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් යුක්ත වේ.

09. ඇගයීමේ ක්‍රමවේදය :

| | ලකුණු |
|---|---|
| සාමාන්‍ය දැනීම (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 01) |
| බුද්ධි පරීක්ෂණය (ලිඛිත පරීක්ෂණය) | 100 (කාලය පැය 01) |
| යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය | 50 |

**I සාමාන්‍ය දැනීම (කාලය පැය 01යි ලකුණු 100 )**

ඉහත 06 හි දක්වා ඇති පරිදි තනතුරට අදාළ රාජකාරි ඉටු කිරීමට අවශ්‍ය සාමාන්‍ය දැනීම

**II බුද්ධි පරීක්ෂණය (කාලය පැය 01යි ලකුණු 100 )**

අපේක්ෂකයන්ගේ සංඛ්‍යාමය හැකියාව, තර්කන ශක්තිය හා සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සකස් කර ඇති බහුවරණ මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි.

**III යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය (ලකුණු 50 )**

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයන් විසින් මෙහි 10 ඡේදය යටතේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ ලකුණු ලබා දීම සිදු කරනු ලැබේ. ලකුණු ලබා දීම සඳහා සලකා බලනු ලබන සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු යි. මෙහි දී සිතාමතා අසත්‍ය තොරතුරු ඇතුළත් කරන ලද බව පෙනී ගියහොත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව අයදුම්කරුවන්ට සහ එම අයදුම්පත් සහතික කරන ලද දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට එරෙහිව කටයුතු කරනු ලැබේ.

මෙම තරග විභාගය මගින් පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය යන එක් එක් විෂයය සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් බැගින් ලබා සමත් විය යුතු ය. ලිඛිත විභාගයේ කුසලතා අනුපිළිවෙළ අනුව සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. (ලිඛිත පරීක්ෂණයේ ලකුණු හෝ කුසලතා අනුපිළිවෙළ

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ලබා දෙනු නොලැබේ) ඒ අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් අනුමත ලකුණු ලබා දීමේ පටිපාටිය අනුව ලකුණු ලබා දෙන අතර මූලික සුදුසුකම් ද පරීක්ෂා කරනු ලැබේ. ලබා ගත් ලකුණු සහ යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුව මත එක් එක් අයදුම්කරුවන්ගේ කුසලතාව නිර්ණය කරනු ලැබේ.

10. **කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) ඛණ්ඩ - 02 සේවා ගණය සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය අනුව තාක්ෂණ පීඨ සහකාර (ඉංජිනේරු තාක්ෂණවේදය) තනතුරට සීමිත පදනම මත බඳවා ගැනීම සඳහා වන යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය - ලකුණු ලබා දීමේ පටිපාටිය - 2025(2026)**

| *ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *ලකුණු ලබා දෙන ආකාරය* | *උපරිම ලකුණු* | |
|---|---|---|---|
| 01 .අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>i අ.පො.ස (සා.පෙළ) | • විශිෂ්ට සාමර්ථ්‍යය - එක් විෂයයකට ලකුණු 02 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 01 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් (ගණිතය, මව්බස, ඉංග්‍රීසි තවත් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යය ලබා තිබීමට අමතරව ) | 10 | 15 |
| ii . අ.පො.ස (උ.පෙළ) | • විශිෂ්ට සාමර්ථ්‍යය - එක් විෂයයකට ලකුණු 2 බැගින්<br>• අධි සම්මාන - එක් විෂයයකට ලකුණු 1 බැගින්<br>• සම්මාන - එක් විෂයයකට ලකුණු 0.5 බැගින් | 5 | |
| iii . උපාධි | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. | 15 | |
| 02. සේවා පළපුරුද්ද | අවුරුදු 05න් පසු වැඩිවන සෑම වර්ෂයකටම ලකුණු 02 බැගින් | 15 | 15 |
| 03. පරිගණක හැකියාව<br>• රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට අදාළ ආයතනයෙන් ලිඛිත ලියවිල්ලක් ලබා ගෙන ඉදිරිපත් කළ යුතුයි | රජයේ ලියාපදිංචි ආයතනයකින් පිරිනමන ලද පරිගණක පිළිබඳ ඩිප්ලෝමාව හෝ ඊට ඉහළ සහතිකයක් | 3 | 5 |
| | රජයේ ලියාපදිංචි ආයතනයක පරිගණක පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම. | 2 | |
| 04. මව් භාෂාව හා දෙවන භාෂාව හැර වෙනත් භාෂාවක ප්‍රවීණතාව (සහතික මගින් සනාථ කළ යුතුය) | ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් පිළිබඳව අවම වශයෙන් ඩිප්ලෝමාවක් සම්පූර්ණ කිරීම | 5 | 5 |
| | අ.පො.ස. (උ.පෙළ) විෂයයක් ලෙස ඉංග්‍රීසි හෝ වෙනත් භාෂාවක් හදාරා තිබීම (01 යටතේ ලකුණු ලබා දුන්නේ නම් මේ සඳහා සලකා බලනු නොලැබේ.) | 2 | |
| 05. ආයතනයේ අභිවෘද්ධියට දක්වන ලද දායකත්වය | ප්‍රශංසා ලිපි - එක් ලිපියකට ලකුණු 2.5 බැගින්<br>• තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතුයි. | 5 | 5 |
| | ඇගයීම් එක් ලිපියකට - එක් ලකුණ බැගින්<br>• තමා සේවය කරනු ලබන ආයතන ප්‍රධානි විසින් නිකුත් කර තිබිය යුතුයි. | 5 | |
| 06. සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාව | පෞරුෂත්වය | 3 | 5 |
| | සන්නිවේදන කුසලතා | 2 | |
| | භාෂා හැසිරවීම | 1 | |

(සියලුම සුදුසුකම් අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.)

*සටහන 1*

සහතිකය ඉදිරිපත් කරනු ලබන ආයතනයේ රජයේ ලියාපදිංචි අංකය සහතික පත්‍රයේ සඳහන් විය යුතු අතර එසේ සඳහන් නොවේ නම් රජයේ ලියාපදිංචි බවට ලියාපදිංචි අංකය සඳහන් ලිඛිතව තහවුරු කිරීමක් අදාළ ආයතනය වෙතින් ලබාගෙන ඉදිරිපත් කිරීම අයදුම්කරු විසින් සිදු කළ යුතු ය.

11. සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම් -:

I. අයදුම්පත් පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. මෙම විභාගයට අදාළ රෙගුලාසි අනුව කිසියම් අපේක්ෂකයකු ඊට පෙනී සිටීමට නුසුදුසු වෙතැයි පෙනී යන ලද නම් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ ඊට පසු හෝ යන කවර අවස්ථාවකදී වුව ද ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබිය හැකිය.

II. අපේක්ෂකයකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළිවුවහොත් හෝ ඔහුට/ඇයට තවදුරටත් පත්වීමක් ලබා දීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර මෙම විභාගය හේතුකොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රාජ්‍ය සේවයෙන් පහ කිරීමට වුව ද යටත්වේ.

12. විභාග කොන්දේසි :

මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (Email) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instruction) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. විභාග ගාස්තුව රු. 600.00 කි. විභාග ගාස්තුව ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබාදෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් සිදු කළ යුතු ය.

(*අ*) ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card)

(*ආ*) අන්තර්ජාල ගෙවීම් පහසුකම් සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card With the Facility of Internet Transactions)

(*ඇ*) ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method/ Flex App of Bank of Ceylon )

(*ඈ*) ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් ( Any Branch of the Bank of Ceylon)

*සටහන :-*

ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

14. ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් වශයෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

15. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

16. අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරා ගත යුතු ය.

17. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ

විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වේනොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේ දී / සම්මුඛ පරීක්ෂණයේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

18. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

19. පත්වීම් බලධාරියා විසින් ප්‍රතිඵල නිකුත් කිරීමට සුදුසු දිනයක් දන්වා එවූ පසු ලිඛිත විභාගයෙන් එක් එක් විෂයයට ලබා ගත් ලකුණු / මුළු ලකුණු සඳහන් කළ ප්‍රතිඵල සටහනක් විභාගයට ඉදිරිපත් වූ සියලුම අයදුම්කරුවන් වෙත තැපැල් මඟින් යැවීමට හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා ප්‍රතිඵල නිකුත් කිරීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පියවර ගනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

20. විභාගයට ඇතුළත් කර ගැනීම :

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින පළමු විභාග දිනයේ දී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම *ගැසට් පත්‍රයේ* මුල පළකර ඇත.

***සටහන -*** අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

21. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව :

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳගෙන නොමැති බව තහවුරුකර ගත හැකිවන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

22. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**නාලක කළුවැව,**
ලේකම්.

2026 ජූලි මස 21 වැනි දින,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය,
"ඉසුරුපාය",
බත්තරමුල්ල.

07 - 499/2